{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

ශ්‍රේණිය 11	2026 - අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 01	කාලය	පැය තුනයි

ශිෂ්‍යයාගේ නම / ඇතුළත්වීමේ අංකය :- .....

පාසලේ නම :- .....

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

* අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවල දී (1), (2),(3),(4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිලිතුර තෝරන්න.

පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කසුන්, නුවරඑළිය නගරයේ ගොඩනැගිල්ලක් කුලියට ගෙන 'සුපිරි' නමින් නැවුම් එළවළු සහ පලතුරු සිල්ලරට අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඊට ආසන්නව ගොවිජන සේවා මධ්‍යස්ථානය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා නුවරඑළිය ගොවි සමූපකාර සමිතිය පිහිටා ඇත.

1. 'සුපිරි' ව්‍යාපාරය සපුරාලන මිනිස් අවශ්‍යතාව කුමක්ද?

(1) ප්‍රවාහනය (2) සන්නිවේදනය

(3) ආහාර (4) සෞඛ්‍යය

2. ලාභ අරමුණු නොකරන රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානය වන්නේ,

(1) 'සුපිරි' ව්‍යාපාරයයි. (2) නුවරඑළිය ගොවි සමූපකාර සමිතියයි.

(3) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයි. (4) කසුන්ගේ පෞද්ගලික ව්‍යාපාරයයි.

3. කසුන්ගේ 'සුපිරි' ව්‍යාපාරය අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසියක් වන්නේ,

(1) වගකීම සීමිත වීම ය. (2) තීරණ ගැනීමේදී ස්වාධීනත්වය පැවතීම ය.

(3) විශාල වශයෙන් ප්‍රාග්ධනය රැස් කිරීමට හැකි වීම ය.(4) ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් පැවතීම ය.

4. ප්‍රදේශයේ පිහිටි ගොවිජන සේවා මධ්‍යස්ථානය, 'සුපිරි' ව්‍යාපාරයට,

(1) ශක්තියකි. (2) දුර්වලතාවකි.

(3) අවස්ථාවකි. (4) තර්ජනයකි.

5. ඉහත සිද්ධියට අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) කසුන්, සුපිරි ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසර සාධකයකි. (2) සුපිරි ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් ඇත.

(3) නුවරඑළිය ගොවි සමූපකාර සමිතිය ලාභ අරමුණු කරගත් සංවිධානයකි.

(4) සුපිරි ව්‍යාපාරය පවත්වාගෙන යන ගොඩනැගිල්ල එම ව්‍යාපාරයේ ස්ථාවර වත්කමකි.

6. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වන ඇඟලුම් විදේශ රටවලට විකිණීම (A) ..... වෙළෙඳාම වන අතර, ඕස්ට්‍රේලියාවෙන් කිරිපිටි ලංකාවට ගෙන්වීම (B) ..... වෙළෙඳාම වේ.

මෙම හිස්තැන් (A) හා (B) සඳහා පිළිවෙළින් ගැළපෙන පිළිතුර තෝරන්න.

(1) අපනයන, ආනයන (2) ආනයන, අපනයන

(3) දේශීය, විදේශීය (4) නැවත අපනයන, ආනයන

7. උපකරණ අලෙවි කරන පෞද්ගලික සමාගමකට වඩා ඒකපුද්ගල ව්‍යාපාරයක දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් වන්නේ,

(1) නීතිමය පුද්ගලභාවයක් පැවතීම ය. (2) හිමිකරුට අසීමිත වගකීමක් පැවතීම ය.

(3) වැඩි ප්‍රාග්ධනයක් රැස් කරගත හැකි වීම ය. (4) ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම සුරක්ෂිත වීම ය.

CamScanner

Past Papers Wiki

8. වාණිජ බැංකු විසින් නිකුත් කරන චෙක්පතක පහළින්ම මුද්‍රණය කර ඇති MICR ක්ෂේත්‍රයේ අඩංගු නොවන්නේ කුමක්ද?

(1) චෙක්පත් අංකය (2) බැංකු ශාඛා අංකය

(3) ගිණුම් අංකය (4) චෙක්පතේ අගය (මුදල)

9. ප්‍රවර්ධන උපක්‍රමයක් ලෙස ප්‍රකාශිත පහත වගන්තිය සලකන්න.

"මෙම සතිය ඇතුළත රෙදි සෝදන යන්ත්‍රයක් මිලදී ගන්නා අයට රෙදි සෝදන කුඩු පැකට්ටුවක් නොමිලේ!"

මෙම ප්‍රකාශනයෙන් ඇතුළත් ප්‍රවර්ධන මිශ්‍රණයේ සංරචක පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ප්‍රචාරණය හා පුද්ගලික විකිණීම (2) විකුණුම් ප්‍රවර්ධනය හා වෙළෙඳ ප්‍රචාරණය

(3) වෙළෙඳ ප්‍රචාරණය හා විකුණුම් ප්‍රවර්ධනය (4) ප්‍රචාරණය හා මහජන සබඳතා

10. සමීර සහ නිශාන්ත එක්ව ලී බඩු නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ගිවිසගත් අතර, ඒ සඳහා සාමාජිකයන් දෙදෙනා ප්‍රාග්ධනය යෙදවූහ.

මෙම සිද්ධියට අදාළව ව්‍යාපාරයේ හිමිකාරිත්ව ස්වරූපය සහ යොදවන ලද සම්පත් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) තනිපුද්ගල ව්‍යාපාරය සහ ශ්‍රමය (2) හවුල් ව්‍යාපාරය සහ ප්‍රාග්ධනය

(3) සීමිත සමාගම සහ භූමිය (4) සමුපකාර සමිතිය සහ සංවිධානය

පහත කොරතුරු භාවිත කර, අංක 11, 12 හා 13 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. නව මෝස්තරයේ ජංගම දුරකථන නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් නව පාරිභෝගිකයන් ආකර්ෂණය කරගැනීමට වෙළෙඳපොළ සමීක්ෂණයක් සිදු කරයි.

B. එහි ප්‍රතිඵලයක් ලෙස "රු. 45,000 ක විශේෂ වට්ටම් මිලකට" ජංගම දුරකථන වෙළෙඳපොළට හඳුන්වා දීමට තීරණය කරන ලදී.

11. ඉහත සිද්ධියේ (A) සහ (B) යන පද මගින් නිරූපණය වන අලෙවිකරණ මිශ්‍රණයේ අංග පිළිවෙළින් වන්නේ,

(1) නිෂ්පාදිතය සහ මිල (2) ස්ථානය සහ ප්‍රවර්ධනය

(3) ප්‍රවර්ධනය සහ නිෂ්පාදිතය (4) මිල සහ ස්ථානය

12. ඉහත සිද්ධියේ (A) හි සඳහන් අලෙවිකරණ සමීක්ෂණය අයත් වන්නේ කළමනාකරණ කාර්යන්ගෙන් කුමකටද?

(1) සංවිධානය කිරීම (2) සැලසුම් කිරීම

(3) මෙහෙයවීම (4) පාලනය කිරීම

13. අදාළ ව්‍යාපාරයේ අභ්‍යන්තර හා බාහිර පරිසර සාධක පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) ව්‍යාපාරයේ තාක්ෂණය සහ රාජ්‍ය ප්‍රතිපත්ති (2) සේවකයින්ගේ කුසලතා සහ තරඟකරුවන්ගේ ක්‍රියාකාරිත්වය

(3) පාරිභෝගික රුචිකත්වය සහ කළමනාකරුවන් (4) ආර්ථික තත්ත්වය සහ ව්‍යාපාරික සංස්කෘතිය

14. තොග වෙළෙඳාම පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) තොග වෙළෙන්දා සෑම විටම අවසාන පාරිභෝගිකයාට කුඩා ප්‍රමාණවලින් භාණ්ඩ අලෙවි කරයි.

(2) තොග වෙළෙන්දා, නිෂ්පාදකයා සහ සිල්ලර වෙළෙන්දා අතර සම්බන්ධකයකු ලෙස ක්‍රියා කරයි.

(3) තොග වෙළෙඳාම සඳහා සෑම විටම විශාල ප්‍රමාණයේ ප්‍රචාරණ වියදම් දරනු ලබයි.

(4) තොග වෙළෙන්දා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කාර්යයේ කෙලින්ම නිරත වේ.

15. කළමනාකරණ කාර්යයන් දෙකක් පහත දැක්වේ.

A - ව්‍යාපාරයේ අරමුණු ඉටු කරගැනීම සඳහා සේවකයින් මෙහෙයවීම හා දිරිගැන්වීම.

B - ව්‍යාපාරයේ අනාගත ඉලක්ක සපොරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කලින් තීරණය කිරීම.

ඉහත කාර්යයන් දෙක පිළිවෙළින් අයත් වන්නේ,

(1) මෙහෙයවීම හා සැලසුම්කරණය ය. (2) සැලසුම්කරණය හා මෙහෙයවීම ය.

(3) සංවිධානය කිරීම හා පාලනය ය. (4) මෙහෙයවීම හා පාලනය ය.

16. ස්ථාවර තැන්පතුවලට වඩා මුදල් ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කිරීමේ වාසියක් වන්නේ,

(1) ඉහළ පොලී ආදායමක් ලැබීම ය.

CamScanner

(2) අවශ්‍ය ඕනෑම අවස්ථාවක පහසුවෙන් මුදල් ආපසු ලබාගත හැකි වීම ය.

(3) ස්ථාවර කාලපරිච්ඡේදයක් සඳහා මුදල් තැන්පත් කර තැබීමට සිදු වීම ය.

(4) රජයේ පූර්ණ ආරක්ෂාව ලැබීම ය.

17. 'ගිණුම්කරණය' යනු,

(1) ව්‍යාපාරයක සිදුවන මූල්‍යමය ගනුදෙනු පොත්වල සටහන් කිරීම පමණි.

(2) ව්‍යාපාරික තීරණ ගැනීමට අදාළ පාර්ශවයන්ට මූල්‍ය තොරතුරු සන්නිවේදනය කිරීමේ ක්‍රියාවලියයි.

(3) ව්‍යාපාරයේ ප්‍රවර්ධන කටයුතු සංවිධානය කිරීමේ ක්‍රියාවලියයි.

(4) සේවකයන්ගේ දක්ෂතා ඇගයීමේ ක්‍රියාවලියයි.

18. ව්‍යාපාරයක ජංගම නොවන වත්කමක් වන්නේ,

(1) තොගය ය. (2) වෙළෙඳ ලැබිය යුතු දෑ ය.

(3) මෝටර් රථ ය. (4) බැංකු ශේෂය ය.

19. වැටුප් ගෙවීම් සටහන් කිරීම සඳහා මූලික සටහන් පොත සහ ගිණුම පිළිවෙළින් දැක්වෙන්නේ,

(1) සුළු මුදල් පොත සහ වැටුප් ගිණුම ය. (2) මුදල් පොත සහ වැටුප් ගිණුම ය.

(3) විකුණුම් ජර්නලය සහ මුදල් ගිණුම ය. (4) ගැනුම් ජර්නලය සහ ණයහිමියන්ගේ ගිණුම ය.

20. ව්‍යාපාරයක් රු. 35 000 ක් වෙළෙඳ ණයගැතියන්ගෙන් මුදල් ලබාගැනීම් සටහන් කිරීම සඳහා භාවිත කරන මූලික සටහන් පොත වන්නේ,

(1) මුදල් පොත ය. (2) විකුණුම් ජර්නලය ය.

(3) ගැනුම් ජර්නලය ය. (4) පොදු ජර්නලය ය.

21. ව්‍යාපාරයක් විසින් පිළියෙල කරනු ලබන මුදල් පොතේ හර පැත්තේ සටහන් වන්නේ,

(1) සියලුම මුදල් ගෙවීම් ය. (2) සියලුම මුදල් ලැබීම් ය.

(3) සියලුම ණයට මිලදී ගැනීම් ය. (4) සියලුම ණයට විකුණුම් ය.

22. ලී බඩු වෙළෙඳ ව්‍යාපාරක ගැනුම් ජර්නලයේ සටහන් කරනු ලබන ගනුදෙනුව කුමක්ද?

(1) රු. 80 000 ක් ව්‍යාපාරයට ප්‍රාග්ධනය ලෙස යෙදවීම

(2) රු. 40 000 ක් වටිනා ලී බඩු නැවත විකිණීමට ණයට මිලදී ගැනීම

(3) රු. 55 000 ක ලී බඩු කාර්යාලය සඳහා ණයට ගැනීම

(4) ඉහත සියල්ලම

23. ව්‍යාපාරයක හිමිකම (ප්‍රාග්ධනය) වැඩිවන සහ වත්කම් වැඩිවන ගනුදෙනුව වන්නේ,

(1) අයිතිකරු විසින් පෞද්ගලික මුදල් රු. 50 000 ක් ව්‍යාපාරයට යෙදවීම

(2) ණය හිමියෙකුට රු. 20 000 ක් ගෙවීම

(3) අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට රු. 10 000 ක් ගැනිලි ලෙස ගැනීම

(4) බැංකුවෙන් රු. 100 000 ක ණයක් ලබා ගැනීම

24. ව්‍යාපාරයක කාර්යාලීය පරිගණකයක් සඳහා රු. 120 000 ක් මුදලින් ගෙවා මිලදී ගැනීමේ බලපෑම,

(1) වත්කම් වැඩි වී වත්කම් අඩු වේ. (2) වත්කම් වැඩි වී හිමිකම වැඩි වේ.

(3) වත්කම් අඩු වී වගකීම් අඩු වේ. (4) හිමිකම වැඩි වී වගකීම් වැඩි වේ.

25. සිරිවැය රු. 40 000 ක් වන තොගයක් රු. 50 000 කට ණයට විකිණීම නිසා ව්‍යාපාරයේ,

(1) වත්කම් හා හිමිකම රු. 10 000 කින් පමණක් වැඩි වේ.

(2) වත්කම් හා හිමිකම රු. 40 000 කින් පමණක් වැඩි වේ.

(3) වත්කම් රු. 50 000 කින් වැඩි වී, හිමිකම රු. 10 000 කින් වැඩි වේ.

(4) වත්කම් රු. 40 000 කින් අඩු වී, හිමිකම රු. 10 000 කින් වැඩි වේ.

PAST PAPERS WIKI

CamScanner

26. ණයට රු. 20 000 ක තොගයක් ගැනීමෙදී සැපයුම්කරු විසින් 10% ක වෙළෙඳ වට්ටමක් හිමි විය. මෙම ගනුදෙනුවට අදාළ නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

(1) ගැනුම් ගිණුම හර රු. 20 000 / ණයකිම් ගිණුම බැර රු. 20 000

(2) ගැනුම් ගිණුම හර රු. 18 000 / ණයකිම් ගිණුම බැර රු. 18 000

(3) ගැනුම් ගිණුම හර රු. 20 000 / ලද වට්ටම් ගිණුම බැර රු. 2 000 / ණයකිම් ගිණුම බැර රු. 18 000

(4) ගැනුම් ගිණුම හර රු. 18 000 / ලද වට්ටම් ගිණුම බැර රු. 2 000

27. අමල්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනට සුළු මුදල් පොතේ ඉතිරිය ලෙස රු. 2 500 ක් තිබූ අතර මාසය තුළ ගෙවීම් රු. 7 500 ක් විය. 2026.01.01 දින අග්‍රමය සඳහා සුළු මුදල් භාරකරුට නැවත ප්‍රතිපූර්ණය කරන ලද මුදල කොපමණද?

(1) රු. 2 500 යි. (2) රු. 7 500 යි.

(3) රු. 10 000 යි. (4) රු. 5 000 යි.

28. බැංකු ප්‍රකාශනය ලැබුණු පසු ව්‍යාපාරයක බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමේදී එම ගිණුමේ හර පැත්තේ සටහන් කරනු ලබන අයිතමයක් වන්නේ,

(1) බැංකු ගාස්තු ය. (2) සෘජු ප්‍රේෂන ය.

(3) නිකුත්කල චෙක්පත් ය. (4) තැන්පත්කල චෙක්පත් ය.

29. බැංකුව විසින් චෙනත් අයෙකුගේ චෙක්පතක් වැරදීමෙන් අපගේ ව්‍යාපාරික ගිණුමට බැර කර තිබීම නිසා ඇතිවන බලපෑම වන්නේ,(1) බැංකු ප්‍රකාශනයේ ශේෂය බැංකු ගිණුමේ ශේෂයට වඩා වැඩි වීම ය.

(2) බැංකු ප්‍රකාශනයේ ශේෂය බැංකු ගිණුමේ ශේෂයට වඩා අඩු වීම ය.

(3) බැංකු ගිණුමේ ශේෂය වැඩි වීම ය.

(4) බැංකු ගිණුමේ ශේෂය අඩු වීම ය.

30. ව්‍යාපාරයක ගිණුම්කරණයේදී සිදු වූ දෝෂයක් නිසා ශේෂ පිරික්සුමේ සමතුලිතතාවයට බලපෑමක් නොවන දෝෂයක් වන්නේ,

(1) රු. 8 000 ක විදුලි බිල ගෙවීම විදුලි ගාස්තු ගිණුමේ සටහන් නොවීම.

(2) රු. 5 000 ක ගොඩනැගිලි අලුත්වැඩියා වියදම ගොඩනැගිලි ගිණුමට හර කිරීම.

(3) රු. 12 000 ක ණයට විකුණුමක් ණයගැති ගිණුමේ රු. 21 000 ලෙස සටහන් වීම.

(4) ඉහත සියල්ලම.

31. යන්ත්‍රයක් රු. 50 000 කට අත්පිට මුදලට විකිණීම අදාළ පොදු ජර්නලයේ සටහන් කරන නිවැරදි ආකාරය වන්නේ,

(1) යන්ත්‍ර ගිණුම හර රු. 50 000 / මුදල් ගිණුම බැර රු. 50 000

(2) මුදල් ගිණුම හර රු. 50 000 / යන්ත්‍ර ගිණුම බැර රු. 50 000

(3) පොදු ජර්නලයේ සටහන් නොවේ

(4) යන්ත්‍ර විකිණීමේ ගිණුම හර රු. 50 000 / මුදල් ගිණුම බැර රු. 50 000

පහත කොරතුරු භාවිතයෙන් අංක 32 සහ 33 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නිෂ්පාදන ව්‍යාපාරයක ඇඳුම් 1 000 ක් නිෂ්පාදනය කිරීම සඳහා වූ පිරිවැය පහත දැක්වේ.

පිරිවැය අයිතමය	රු.
රෙදි හා නූල් සඳහා	120 000
ඇඟලුම් මසන්නාගේ වේතන	80 000
විදුලි වියදම (කර්මාන්තශාලා)	30 000
ගොඩනැගිලි කුලිය (කර්මාන්තශාලා)	20 000
යන්ත්‍ර ක්ෂය	10 000
සුපරීක්ෂක වේතනය	40 000

32. මෙම ව්‍යාපාරයේ නිෂ්පාදනය සඳහා වූ සෘජු පිරිවැය කොපමණද?

(1) රු. 200 000 (2) රු. 230 000

(3) රු. 250 000 (4) රු. 300 000

CamScanner

33. මෙම ව්‍යාපාරයේ නිෂ්පාදනය කරන ලද **ඇඳුමක ඒකක නිෂ්පාදන පිරිවැය** කොපමණද?

(1) රු. 200 (2) රු. 230

(3) රු. 300 (4) රු. 350

34. ක්‍රීඩා සමාජයක සාමාජික සංඛ්‍යාව 100 කි. එක් සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 500 කි. 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සාමාජිකයින් 80 දෙනෙකු පමණක් වාර්ෂික මුදල් ගෙවා නිබුණි.

2025.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් වියදම් ගිණුමට බැර කළ යුතු සාමාජික මුදල කොපමණද?

(1) රු. 40 000 (2) රු. 50 000

(3) රු. 10 000 (4) රු. 60 000

පහත සඳහන් තොරතුරු භාවිත කරමින් අංක 35 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

'නිමල්ගේ ව්‍යාපාරයේ' 2025.12.31 දිනට **ශේෂ** පිරික්සුම් පහත දැක්වේ.

	හර (රු.)	බැර (රු.)
ගැනුම් / විකුණුම්	2500 000	4000 000
2025.01.01 දිනට තොගය	200 000	
2025.01.01 දිනට ගොඩනැගිලි පිරිවැය	3000 000	
2025.01.01 දිනට මෝටර් රථ පිරිවැය	1500 000	
10% බැංකු ණය		600 000
ණයගැතියෝ / ණයහිමියෝ	150 000	300 000
ප්‍රවාරණ වියදම්	100 000	
සේවක වැටුප්	120 000	
බැංකු ණය පොලී	30 000	
විදුලි වියදම්	60 000	
ප්‍රාග්ධනය (2025.01.01 දිනට)		2800 000
ලැබූ වට්ටම්		30 000
මුදල්	70 000	
	7 730 000	7 730 000

අතිරේක තොරතුරු:

1. 2025.12.31 දිනට අවසාන තොගය රු. 300 000 කි.
2. 2025.12.31 දිනට ගෙවිය යුතු සේවක වැටුප් රු. 30 000 කි.
3. මෝටර් රථ සඳහා පිරිවැය මත වසරකට 10% ක ක්ෂය කිරීමක් කළ යුතුය.

35. නිමල්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය,

(1) රු. 1 300 000 (2) රු. 1 600 000

(3) රු. 1 800 000 (4) රු. 2 400 000

36. නිමල්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂයේ අලෙවි හා පරිපාලන **මෙහෙයුම් වියදම්වල එකතුව,**

(1) රු. 310 000 (2) රු. 460 000

(3) රු. 490 000 (4) රු. 520 000

37. නිමල්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ඇතුළත් වන **ණය පොලී වියදම්,**

(1) රු. 30 000 (2) රු. 100 000

(3) රු. 90 000 (4) රු. 60 000

38. නිමල්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂයේ **ශුද්ධ ලාභය,**

(1) රු. 1 080 000 (2) රු. 1 110 000

(3) රු. 1 180 000 (4) රු. 1 270 000

39. නිමල්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනට ජංගම නොවන වත්කම්වල **ශුද්ධ පොත් අගය,**

(1) රු. 4 200 000 (2) රු. 4 350 000

(3) රු. 4 500 000 (4) රු. 4 800 000

40. නිමල්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනට **හිමිකම්**

(1) රු. 3 880 000 (2) රු. 3 910 000 (3) රු. 3 980 000 (4) රු. 4 070 000

CamScanner

(සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித்திணைக்களம் - வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

ශ්‍රේණිය 11	2026 - අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 01	කාලය :

ශිෂ්‍යයාගේ නම / ඇතුළත්වීමේ අංකය :- .....

පාසලේ නම :- .....

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය 11 කොටස

* **පළමුවන ප්‍රශ්නය ඇතුලුව 1 කොටසින් ප්‍රශ්න දෙකක් ද, 11 කොටසින් ප්‍රශ්න දෙකක් බැගින්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිලිතුරු පිළිතුරු සපයන්න.**

1. ඔටෝ මැකැනික් ලෙස සේවය කළ කසුන් ප්‍රනාන්දු 2026.01.01 දින තමා යතු රු. 800 000 ක මූදල ද, රු. 300 000 ක වටිනා යන්ත්‍ර සූත්‍ර හා රු. 50 000 ක අලුත්වැඩියා උපකරණ ද යොදවා 'කසුන් මෝටර්ස්' නමින් වාහන අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. එදින ම ඔහු 8% ක වාර්ෂික පොලියට රු. 300 000 ක බැංකු ණය මුදලක් ද ලබා ගත්තේ ය. වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු වූයේ නැත.

කසුන් ප්‍රනාන්දු ව්‍යාපාරය ආරම්භ කිරීමේ දී සිදු වූ ගනුදෙනු පහත දැක්වේ:

ගනුදෙනුව		රුපියල් (රු.)
වාහන අලුත්වැඩියා කිරීමෙන් ලත් ආදායම		900 000
මාසය තුළ අලුත්වැඩියා සඳහා වැය වූ ද්‍රව්‍ය පිරිවැය		350 000
මාසික විදුලි ගාස්තු ගෙවීම		8 000
මාසික රක්ෂණ ගාස්තු ගෙවීම		3 000
මාසික ගොඩනැගිලි කුලී ගෙවීම		25 000
සේවක වැටුප් ගෙවීම -	නිමල්	50 000
	සුනිල්	35 000
2026.01.31 දින සහන ලී බඩු වෙළෙඳසැලෙන් ලී බඩු ණයට ගැනීම		150 000

'කසුන් මෝටර්ස්' ව්‍යාපාරය ෆේස්බුක් (Facebook) පිටුවක් හරහා ප්‍රචාරණය කරන අතර දුරකථන මාර්ගයෙන් වේලාවන් වෙන්කරගෙන සේවාව ලබා දෙයි.

කසුන් නිතරම තම සේවකයින්ගේ වැඩකටයුතු නිරීක්ෂණය කරමින් උපදෙස් ලබා දෙන අතර, උසස් තත්ත්වයේ අලුත්වැඩියා සේවාවක් සාධාරණ මිලකට ලබා දීමට අපේක්ෂා කරයි.
අමතර තොරතුරු:

යන්ත්‍ර සූත්‍රවල ආයු කාලය වසර 5 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.
අලුත්වැඩියා උපකරණ සඳහා වසරකට 12% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.

(i) (අ) 'කසුන් මෝටර්ස්' නිෂ්පාදනයේ ස්වභාවය අනුව අයත් වන්නේ කුමන වර්ගයේ ව්‍යාපාරයකට ද?

(ආ) 'කසුන් මෝටර්ස්' නාමය ලියාපදිංචි කළ යුතු ද? ඊට හේතුව ලියන්න.

(ii) (අ) 'කසුන් මෝටර්ස්' හි ශක්තීන් හා දුර්වලතාවන් දෙක බැගින් ලියන්න.

(ආ) 'කසුන් මෝටර්ස්' ලබාගෙන ඇති උපකාරක සේවා දෙකක් නම් කර, ඒවා සඳහා සිද්ධිය ඇසුරෙන් නිදසුන් බැගින් ලියන්න.

Past Papers Wiki
CamScanner

(iii) (අ) 'කසුන් මෝටර්ස්' හා සම්බන්ධ පහත සඳහන් එක් එක් නිෂ්පාදන සාධකය සඳහා නිදසුන් බැගින් ලියන්න.

1. ශ්‍රමය
2. ප්‍රාග්ධනය

(ආ) ඉහත සිද්ධියේ ඇතුළත් පහත එක් එක් ව්‍යාපාර ක්‍රියාකාරකම අයත් වන කළමනාකරණ කාර්යය සඳහන් කරන්න.

1. ව්‍යාපාරයට නිමල් සහ සුනිල් සේවකයින් ලෙස බඳවා ගැනීම
2. සේවකයින්ගේ වැඩකටයුතු නිතර සොයා බැලීම

(iv) (අ) 'කසුන් මෝටර්ස්' හි අලෙවිකරණයට අයත් වන කටයුතු දෙකක් ලියන්න.

(ආ) සිද්ධියේ ඇතුළත් ආයෝජන මාර්ගයක් නම් කර, එයින් ලැබෙන ප්‍රතිලාභයක් සඳහන් කරන්න.

(v) 'කසුන් මෝටර්ස්' හි 2026.01.01 දිනට ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිතව ලියා දක්වන්න.

(vi) (අ) 'කසුන් මෝටර්ස්' 2026.01.01 දින (ආරම්භයේ) භාවිත කළ මූලාශ්‍ර ලේඛණ දෙකක් සඳහන් කරන්න.

(ආ) ඉහත (vi) (අ) හි නම් කළ එක් එක් මූලාශ්‍ර ලේඛනයට අදාළ සිද්ධියේ ඇතුළත් ගනුදෙනුව බැගින් ලියන්න.

(vii) 'කසුන් මෝටර්ස්' හි 2026.01.31 දිනට මුදල් ශේෂය ගණනය කරන්න.

(viii) 'කසුන් මෝටර්ස්' හි 2026.01.31 දිනෙන් අවසන් මාසය සඳහා යන්ත්‍ර සූත්‍ර ක්ෂය සහ අලුත්වැඩියා උපකරණ ක්ෂය වෙන වෙන ම ගණනය කරන්න.

(ix) 'කසුන් මෝටර්ස්' හි 2026.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන විෂයම් වටිනාකම් සහිතව ලියන්න.

(x) 'කසුන් මෝටර්ස්' හි 2026.01.31 දිනට පහත අයිතම්වල මුළු වටිනාකම් සඳහන් කරන්න.

(අ) ජංගම නොවන වත්කම්

(ආ) ජංගම වගකීම්

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න දෙකකට පමණක් පිලිතුරු සපයන්න)

2. (i) භවුල් ව්‍යාපාරයක් සහ සීමිත පොදු සමාගමක් අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න. **(ලකුණු 02 යි)**

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය පාලනය කළ හැකි **සුවිශේෂී** සාධකවලින් සමන්විත වේ.

(ආ) පාරිභෝගික ආරක්ෂණය සඳහා විධිමත් ලෙස කටයුතු කරන රාජ්‍ය ආයතනයක් ලෙස ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය හැඳින්විය හැක.

(ඇ) රාජ්‍ය අංශයේ ව්‍යාපාරවල ප්‍රධාන අරමුණ වන්නේ උපරිම ලාභ ලැබීමයි.

(ඈ) නව තාක්ෂණය භාවිතය මගින් ව්‍යාපාරයක නිෂ්පාදනය හා කාර්යක්ෂමතාව ඉහළ යයි. **(ලකුණු 02 යි)**

(iii) 'සුජාතා' මහත්මිය විසින් ප්‍රදේශයේ කාන්තාවන් එකතු කරගනිමින් අත්කම් භාණ්ඩ නිෂ්පාදනය කර විදේශ රටවලට අපනයනය කිරීම සඳහා නව ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

(අ) මෙම ප්‍රකාශයේ ඇතුළත් සිද්ධියට අනුව මෙම ව්‍යාපාරයේ අභ්‍යන්තර පාර්ශ්වයක් සහ බාහිර පාර්ශ්වයක් පිළිවෙළින් ලියන්න.

(ආ) මෙහි සඳහන් ව්‍යාපාරික කටයුත්තට අදාළව පහත සඳහන් එක එක අංශය නියෝජනය කරන පරිසර සාධක නම් කරන්න

1. විදේශයන්ට අත්කම් භාණ්ඩ අපනයනය කිරීම
2. අත්කම් නිෂ්පාදනය සඳහා නව යන්ත්‍ර සූත්‍ර භාවිත කිරීම **(ලකුණු 02 යි)**

CamScanner

(iv) වෙළෙඳාමට සම්බන්ධ සිදුවීම් දෙකක් පහත දැක්වේ.

A - සුනිල්, තමන් නිපදවූ එළවළු ප්‍රදේශයේ වෙළෙඳුන්ට තොග වශයෙන් අලෙවි කරයි.

B - අමල්, ජපානයෙන් ආනයනය කරන ලද විදුහුත් උපකරණ ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයින්ට අලෙවි කරයි.

(අ) ඉහත සඳහන් සිදුවීම් දෙකට අදාළ වෙළෙඳ ආකාර පිළිවෙළින් හඳුනාගෙන නම් කරන්න.

(ආ) වෙළෙඳාමට සහාය වන උපකාරක සේවා දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

3. (i) ජංගම ගිණුමක් සහ ස්ථාවර තැන්පතු ගිණුමක් අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) චෙක්පතක් රේඛනය කිරීම මගින් ඊට අදාළ මුදල් ආරක්ෂිතව ලබාගත හැක.

(ආ) රක්ෂණයේදී හානිපූර්ණ මූලධර්මය ජීවිත රක්ෂණය සඳහා ද එකසේ බලපායි.

(ඇ) අන්තර්ජාල බැංකුකරණය මගින් පාරිභෝගිකයන්ට පැය 24 පුරාම සේවා ලබාගත හැක.

(ඈ) විදුලි සන්දේශ සේවා සපයන ප්‍රධාන රාජ්‍ය ආයතනයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව හැඳින්විය හැක. (ලකුණු 02 යි)

(iii) 2026.02.15 දින ඇති වූ අකුණු සැර වැදීමකින් සමන්ගේ ඇහලුම් කර්මාන්තශාලාවේ විදුලි පරිපථයට හානි සිදු වී රු. 300 000 ක අලාභයක් සිදු විය. එම කර්මාන්තශාලාව ගිනි රක්ෂණ ආවරණයකට යටත් කර තිබූ අතර, අලාභය සම්බන්ධයෙන් පරීක්ෂා කළ රක්ෂණ සමාගම මගින් රු. 300 000 ක වන්දි මුදලක් ගෙවීමට තීරණය කරන ලදී.

(අ) මෙම සිදුවීමට අදාළව අලාභය සඳහා හේතු වූ ආසන්නතම අවදානම කුමක්ද?

(ආ) රක්ෂණ සමාගම මගින් මුළු අලාභයටම වන්දි ලබාදීමට පදනම් වූ රක්ෂණ මූලධර්මය කුමක්ද? (ලකුණු 02 යි)

(iv) රොහාන් සිය ව්‍යාපාරික අවශ්‍යතා සඳහා තොරතුරු සහ සන්නිවේදනය සඳහා නවීන තාක්ෂණය යොදා ගනී. ඔහු තම නිපැයුම් ප්‍රවර්ධනය කිරීමට සමාජ මාධ්‍ය භාවිත කරන අතර, පාරිභෝගික අදහස් ලබාගැනීමට විදුහුත් තැපැල් භාවිත කරයි.

(අ) මෙම සිදුවීමේ ඇතුළත් සන්නිවේදන මාධ්‍ය දෙකක් ලියන්න.

(ආ) ව්‍යාපාරයකට සාර්ථක සන්නිවේදනයක් පැවතීමෙන් ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

4. (i) කළමනාකරණයේ දී 'සැලසුම්කරණය' යනු කුමක්ද? (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) සංවිධාන අරමුණු ඉටු කරගැනීමට සේවකයන් මෙහෙයවීම හා දිරිගැන්වීම 'මෙහෙයවීම' කාර්යයට අයත් වේ.

(ආ) අලෙවිකරණ මිශ්‍රණයේ විචල්‍යයන් ව්‍යාපාරයකට පාලනය කළ නොහැකි බාහිර සාධක වේ.

(ඉ) ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීමට භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරයි.

(ඊ) කොළඹ කොටස් වෙළෙඳපොළේ සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීම බැංකු ඉතිරි කිරීමේ ගිණුමකට වඩා අවදානම් අඩු ක්‍රමයකි. (ලකුණු 02 යි)

(iii) ඇහලුම් නිෂ්පාදනය කර අලෙවි කරන ව්‍යාපාරයක කාර්යන් කිහිපයක් පහත දැක්වේ.

A - ඇඳුම් 10 කට වඩා මිලදී ගැනීමේදී 15% ක මිල වට්ටමක් ලබා දීම

B - පාරිභෝගික රුචිකත්වයට අනුව නවීන පෙනුමෙන් යුතු නිමිඇඳුම් මසනු ලැබීම

C - ප්‍රදේශයේ ප්‍රධාන බස් නැවැතුම්පොළ අසල ප්‍රදර්ශනාගාරයක් විවෘත කිරීම

D - ප්‍රදේශයේ පාසල් ක්‍රීඩා උත්සවයකට අනුග්‍රහය දක්වමින් ව්‍යාපාරික නාමය ප්‍රචාරය කිරීම.

ඉහත එක් එක් කාර්යයට අදාළ අලෙවි මිශ්‍රණයේ විචල්‍යය පිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

CamScanner

(iv) රාජ්‍ය සේවයේ නියුතු නිමල් තමාගේ රු. 600 000 ක මුදල ආයෝජනය කර ඇත්තේ මෙසේ ය.

A - කොටසක් රු. 50 බැගින් සාමාන්‍ය කොටස් 4 000 ක් ලැයිස්තුගත සමාගමකින් මිලදී ගැනීම

B - රු. 400 000 ක මහජන බැංකුවේ ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම

(අ) ඉහත එක් එක් ආයෝජන මාර්ගයෙන් නිමල්ට ලැබෙන ප්‍රතිලාභය බැගින් වෙන් වෙන්ව පිළිවෙළින් සඳහන් කරන්න.

(ආ) ඉහත ආයෝජන මාර්ග දෙකෙන් අවදානම් වැඩි ම ආයෝජන මාර්ගය නම් කර, එයට හේතුව ලියන්න.

(ලකුණු 02 යි) (මුළු ලකුණු 08 යි)

II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න දෙකකට පමණක් පිලිතුරු සපයන්න)

5.(i) ගිණුම්කරණයේ දී මූල්‍ය තොරතුරු භාවිත කරන්නන් දෙදෙනෙකු සහ ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාව බැගින් ලියන්න.

(ලකුණු 02 යි)

(ii) ව්‍යාපාරයක මුදල් පොතේ බැර පැත්තේ සටහන් කරනු ලබන ගනුදෙනු දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) නිමල්ගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු දෙකක් ගිණුම්කරණ සමීකරණයට බලපෑ ආකාරය පහත දැක්වේ.

ගනුදෙනු අංකය	වත්කම්		හිමිකම (රු.)	වගකීම්	
	ලී බඩු	+ මුදල්		ණයකම්යෝ	+ බැංකු ණය
(1)	+ 40 000			+ 40 000	
(2)		- 15 000			- 15 000
(3)					
(4)					

අවශ්‍ය වන්නේ:

(අ) ඉහත ගනුදෙනු අංක (1) සහ (2) විස්තර කර ලියන්න.

(ආ) පහත සඳහන් ගනුදෙනු අංක (3) සහ (4), නිමල්ගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය සටහන් කර දක්වන්න.

(3) - රු. 20 000 ක් වටිනා ලී බඩු රු. 25 000 කට අත්පිට මුදලට විකිණීම.

(4) - රු. 10 000 ක ව්‍යාපාරික මුදල් පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම. (ලකුණු 04 යි)

(iv) නිහාල්ගේ ව්‍යාපාරයේ 2026 මැයි මාසයේ සිදු වූ මිලදී ගැනීම් කිහිපයක් පහත දැක්වේ.

2026.05.02 - අමල්ගෙන් ඉන්වොයිස් අංක 101 යටතේ රු. 80 000 ක භාණ්ඩ මිලදී ගන්නා ලදී.

2026.05.10 - කමල්ගෙන් ඉන්වොයිස් අංක 105 යටතේ රු. 60 000 ක භාණ්ඩ මිලදී ගන්නා ලදී.

2026.05.18 - අමල්ගෙන් ඉන්වොයිස් අංක 110 යටතේ ලබාගත් රු. 50 000 ක භාණ්ඩවලින් වෙළෙඳ වට්ටම 10% ක් ලැබී තිබුණි.

2026.05.25 - නිමල්ගෙන් ඉන්වොයිස් අංක 112 යටතේ ලබාගත් රු. 100 000 ක භාණ්ඩවලින් රු. 30 000 ක වෙළෙඳ වට්ටම් ලැබී තිබුණි.

අවශ්‍ය වන්නේ:

(අ) 2026 මැයි මාසය සඳහා නිහාල්ගේ ව්‍යාපාරයේ ගැනුම් ජර්නලය පිළියෙල කිරීම.

(ආ) නිහාල්ගේ ව්‍යාපාරයේ ගැනුම් ජර්නලයේ එකතුව ලෙජර් ගිණුම්වලට පිටපත් කරන ආකාරය (ද්විත්ව සටහන) දක්වන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

CamScanner

6.

(i) ගිණුම්කරණයේ දී 'වක්කමක්' සහ 'වගකීමක්' යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වා දෙන්න. *(ලකුණු 02 යි)*

(ii) සමන්ගේ ව්‍යාපාරයේ නිෂ්පාදනය කරනු ලබන බැග් 1 000 ක් සඳහා වූ පිරිවැය විස්තර පහත දැක්වේ.

රෙදි සහ නූල්..... රු. 50 000

කුලී..... රු. 10 000

විදුලි වියදම්..... රු. 8 000

මසන්නාගේ වේතන..... රු. 30 000

සුපරීක්ෂණ වේතන..... රු. 12 000

අතිරේක තොරතුරු:

බැගයක වෙළෙඳපොළ විකිණුම් මිල රු. 200 කි.

සියලුම බැග් 1 000 විකුණා දමන ලදී.

අවශ්‍ය වන්නේ:

(අ) බැග් නිෂ්පාදනයේ ප්‍රාථමික පිරිවැය ගණනය කිරීම.

(ආ) බැග් නිෂ්පාදනයේ ඒකක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම. *(ලකුණු 02 යි)*

(iii) නිමල්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ අසමතුලිතතාවයක් පැවැති අතර, පසුව සොයාගන්නා ලද වැරදි කිහිපයක් පහත දැක්වේ.

1. විදුලි බිල රු. 8 000 ක් ගෙවීම විදුලි ගාස්තු ගිණුමේ රු. 800 ක් ලෙස සටහන් වී තිබීම.
2. ලද වට්ටම් රු. 5 000 ක් ලද වට්ටම් ගිණුමේ හර පැත්තේ සටහන් කර තිබීම.
3. රු. 12 000 ක් වටිනා යන්ත්‍ර අලුත්වැඩියාවක් යන්ත්‍ර ගිණුමට හර කර තිබීම.

අවශ්‍ය වන්නේ:

(අ) ඉහත වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් (සංලක්ෂය සහිතව).

(ආ) 2025.12.31 දිනට අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීම. *(ලකුණු 04 යි)*

(iv) අමල්ගේ ව්‍යාපාරයේ 2026 ජනවාරි මාසයේ මුදල් පොත සහ බැංකු ප්‍රකාශනය පහත දැක්වේ.

බැංකු ගිණුම

දිනය	විස්තරය	රු.	දිනය	විස්තරය	රු.
2026.01.01	ශේෂය ඉ/ග	15 000	2026.01.05	කුලී (101)	4 000
2026.01.04	ණයගැති (ජයන්ති)	8 000	2026.01.12	ගෑනුම් (102)	10 000
2026.01.10	විකුණුම් (වෙක් 425)	20 000	2026.01.20	ගෑනුම් (103)	6 000
2026.01.18	ණයගැති (වෙක් 822)	10 000	2026.01.28	වැටුප් (104)	8 000
			2026.01.31	ශේෂය ප/ග	25 000
		53 000			53 000

CamScanner

2026 ජනවාරි මාසයේ බැංකු ප්‍රකාශනය

දිනය	විස්තරය	හර (රු.)	බැර (රු.)	ශේෂය (රු.)
2026.01.01	ශේෂය			15 000
2026.01.06	චෙක්පත - 101	4 000		11 000
2026.01.08	තැන්පතුව		8 000	19 000
2026.01.15	චෙක්පත - 102	10 000		9 000
2026.01.22	සෘජු තැන්පතුව		12 000	21 000
2026.01.25	බැංකු ගාස්තු	1 000		20 000
2026.01.30	චෙක්පත් පොත් ගාස්තු	2 000		18 000

අවශ්‍ය වන්නේ:

(අ) 2026.01.31 දිනට සංශෝධිත බැංකු ශිෂ්‍යම පිළියෙල කිරීම.

(ආ) 2026.01.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීම. (ලකුණු 04 යි) (මුළු ලකුණු 12 යි)

7.

(i) 'අගරු චෙක්පත්' යනු කුමක්ද? (ලකුණු 02 යි)

(ii) ක්‍රීඩා සමාජයක 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලත් සහ ගෙවූ මුදල් සාරාංශය පහත දැක්වේ.

සාමාජික මුදල් ලැබීම් රු. 60 000

ගොඩනැගිලි අලුත්වැඩියා ගෙවීම් රු. 15 000

සංගීත ප්‍රසංග වියදම් රු. 25 000

අතිරේක තොරතුරු:

2025.12.31 දිනට උපචිත ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් රු. 5 000 කි.

2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ සාමාජික මුදල් 10 000 කි.

අවශ්‍ය වන්නේ:

2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ශිෂ්‍යම පිළියෙල කිරීම. (ලකුණු 02 යි)

(iii) ප්‍රසන්නගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2025.12.31 දිනට ශේෂ පිරික්සුම් පහත දැක්වේ.

	හර (රු.)	බැර (රු.)
ප්‍රාග්ධනය.....		600 000
මුදල්.....	30 000	
10% බැංකු ණය.....		150 000
ණයගැතියෝ.....	40 000	
ණයහිමියෝ.....		35 000
මෝටර් රථ (පිරිවැය).....	300 000	
ඉඩම් (පිරිවැය).....	500 000	
බැංකු ණය පොලී.....	10 000	

CamScanner

පරිගණක යන්ත්‍ර.....	80 000	
විදුලි ගාස්තු.....	12 000	
තොගය (2025.01.01 දිනට).....	50 000	
ගැනුම්.....	220 000	
විකුණුම්		480 000
ගෙවූ කුලී.....	18 000	
ලැබූ පොලී		10 000
දුරකථන ගාස්තු.....	6 000	
වෙනත් වියදම්.....	4 000	
රක්ෂණ ගාස්තු.....	5 000	
	1275 000	1 275 000

අතිරේක තොරතුරු:

1. 2025.12.31 දිනට ඉතිරි තොගය රු. 60 000 කි.
2. මෝටර් රථ සහ පරිගණක යන්ත්‍ර මත වසරකට 10% බැගින් ක්ෂය කළ යුතුය.
3. 2025.12.31 දිනට ලැබිය යුතු පොලී රු.4 000 කි.
4. **ණයගැතියන්ගෙන්** රු 5 000 ක් **බොල්ණය** ලෙස **කපාහැරිය** යුතුය

අවශ්‍ය වන්නේ:

(අ) 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රසන්නගේ ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04)

(ආ) 2025.12.31 දිනට ප්‍රසන්නගේ ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04)

(මුළු ලකුණු 12)

****

Past Papers Wiki
PAST PAPERS WIKI
CamScanner

{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

ශ්‍රේණිය 11	2026 - අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 01	කාලය :

ශිෂ්‍යයාගේ නම /
ඇතුළත්වීමේ අංකය :- .....
පාසලේ නම :- .....

පිළිතුරු පත්‍රය

1 කොටස

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01	3	08	4	16	2	26	2	33	3
02	3	09	3	17	2	27	2	34	2
03	2	10	2	18	3	28	2	35	2
04	3	11	1	19	2	29	1	36	2
05	1	12	2	20	1	30	2	37	4
06	1	13	2	21	2	31	3	38	2
07	2	14	2	22	2	32	1	39	2
		15	1	23	1			40	2
				24	1				
				25	5				

ii කොටස

01.

(i) **(අ)** සේවා ව්‍යාපාරයකි. (ලකුණු 01)

(ආ) ලියාපදිංචි කළ යුතුය. (ලකුණු 01)

හේතුව: හිමිකරුගේ සම්පූර්ණ නම (කසුන් ප්‍රනාන්දු) වෙනුවට 'කසුන් මෝටර්ස්' යන වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යාම නිසාය.

(ii)

(අ) **ශක්තීන්:** කසුන් ව්‍යත්තීය පුහුණුව/පලපුරුද්ද ලබා තිබීම, උසස් තත්ත්වයේ සේවාවක් ලබා දීම, සාධාරණ මිල ගණන් පැවතීම.

දුර්වලතාවන්: පටන් ගැන්මේ දී සේවකයින්ට අත්දැකීම් නැතිකම, බැංකු ණය පොලී බර. (ලකුණු 01)

(ආ) උපකාරක සේවා:

1. **සන්නිවේදනය** උදා - ෆේස්බුක් , දුරකථන ප්‍රචාරණය
2. **බැංකු සේවා** උදා- රු 300 000 ක බැංකු ණය ලබා ගැනීම
3. **රක්ෂණ සේවා** උදා- මාසික රක්ෂණ ගාස්තු ගෙවීම රු 3 000 (ලකුණු 01)

(iii)

(අ)

1. **ශ්‍රමය:** නිමල්, සුනිල් සහ කසුන්ගේ කායික/මානසික ශ්‍රමය.
2. **ප්‍රාග්ධනය:** යන්ත්‍ර සූත්‍ර, අලුත්වැඩියා උපකරණ, යෙදවූ මුදල. (ලකුණු 01)

(ආ)

1. සංවිධානය කිරීම
2. මෙහෙයවීම (ලකුණු 01)

(iv)

(අ) ෆේස්බුක් හරහා ප්‍රචාරණය කිරීම, දුරකථන/මාර්ගගත ක්‍රමයට වේලාවන් වෙන් කර ගැනීම, සාධාරණ මිල ගණන් නියම කිරීම. (ලකුණු 01)

(ආ) ආයෝජන මාර්ගය: යන්ත්‍ර සූත්‍ර / අලුත්වැඩියා උපකරණ යෙදවීම, ලී බඩු මිලදී ගැනීම.

ප්‍රතිලාභය: ව්‍යාපාරයේ අලුත්වැඩියා කටයුතු කාර්යක්ෂමව කර සේවා ආදායම් ඉපයීමට හැකිවීම. (ලකුණු 01)

(v) වත්කම් = හිමිකම + වගකීම්

1 450 000 = 1 150 000 + 300 000 (ලකුණු 02)

{මුදල් } 800 000 + {යන්ත්‍ර } 300 000 + {උපකරණ } 50 000 + {ණය මුදල් } 300 000 = 850 000 හිමිකම + වගකීම් (බැංකු ණය) 300 000

(vi)

(අ) ලදුපත, ජර්නල් වව්චරය (ලකුණු 01)

(ආ)

1. ලදුපත- හිමිකරු විසින් රු. 800 000 මුදලින් ද, බැංකුවෙන් රු. 300 000 ක ණයක් ලබා ගැනීම, ආදායම් ලැබීම 900000
2. ජර්නල් වව්චරය - අයිතිකරු යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ද ව්‍යාපාරයට යෙදවීම, සහන ලී බඩු වෙළෙඳසැලෙන් රු. 150 000 ක ලී බඩු ණයට ගැනීම.

(ලකුණු 01)

(vii) **අවසාන මුදල් ශේෂය (2026.01.31):** 1 529 000 (ලකුණු 02)

ආරම්භක මුදල් ශේෂය: 800 000 + 300 000 ණය =		1 100 000
එකතු කළා: ලැබුණු මුදල් (ආදායම):		900 000
අඩු කළා: ගෙවූ මුදල්:		
ද්‍රව්‍ය පිරිවැය	350 000	
විදුලි ගාස්තු	8 000	
රක්ෂණ ගාස්තු	3 000	
කුලී ගාස්තු	25 000	
වැටුප් 50 000 + 35 000 =	85 000	
මුළු ගෙවීම්:		(471 000)
ශේෂය		**1529 000**

(viii)

යන්ත්‍ර සූත්‍ර මාසික ක්ෂය: රු 5 000 (300 000 / 5) = 60 000 / 12 = 5 0 0 0 (ලකුණු 01)

අලුත්වැඩියා උපකරණ මාසික ක්ෂය: රු 500 50 000 * 12% = 6 000 / 12 = 500 (ලකුණු 01)

(ix) 2026 ජනවාරි මාසය සඳහා වියදම් රු 493 500

ද්‍රව්‍ය පිරිවැය: රු. 350 000
විදුලි ගාස්තු: රු. 8 000
රක්ෂණ ගාස්තු: රු. 3 000
ගොඩනැගිලි කුලී: රු. 25 000
සේවක වැටුප් (ගෙවිය යුතු සම්පූර්ණ ප්‍රමාණය 60 000 + 40 000): රු. 100 000
බැංකු ණය පොලී වියදම 300 000* 8% / 12): රු. 2 000
යන්ත්‍ර සූත්‍ර ක්ෂය: රු. 5 000
උපකරණ ක්ෂය: රු. 500 (අයිතම 4 කට ලකුණු 1 බැගින්) (ලකුණු 02)

(x)

(අ) ජංගම නොවන වත්කම් (ශුද්ධ අගය): රු 494 500 (ලකුණු 01)

යන්ත්‍ර සූත්‍ර (300 000 - 5 000)	295 000
අලුත්වැඩියා උපකරණ (50 000 - 500)	49 500
ලී බඩු	150 000
එකතුව:	**රු. 494 500**

(ආ) ජංගම වගකීම්: රු 167 000 (ලකුණු 01)

ගෙවිය යුතු වෙළෙඳ ණයහිමියෝ	150 000
ගෙවිය යුතු ගෙවීමට ඇති වැටුප් (100 000 - 85 000)	15 000
ගෙවීමට ඇති ණය පොලිය:	2 000
එකතුව:	**රු. 167 000**

මුලු ලකුණු (2 *10 =20)

2.

(i) **හවුල් ව්‍යාපාරය:** සාමාජික සංඛ්‍යාව 2-20 කි / අසීමිත වගකීමක් පවතී / ලියාපදිංචිය අනිවාර්ය නැත (ව්‍යාපාර නාම පනත යටතේ හැර).

සීමිත පොදු සමාගම: අවම සාමාජික සංඛ්‍යාව 1 කි (උපරිම සීමාවක් නැත) / සීමිත වගකීමක් පවතී / 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචිය අනිවාර්ය වේ. *(ඕනෑම නිවැරදි වෙනස්කම් 2 කට ලකුණු 02)*

(ii) (අ) සත්‍ය
(ආ) සත්‍ය
(ඇ) අසත්‍ය
(ඈ) සත්‍ය (ලකුණු 1/2 කට බැගින්) *(ලකුණු 02)*

(iii)

(අ) **අභ්‍යන්තර පාර්ශ්වය:** ව්‍යාපාරික හිමිකරු (සුජාතා මහත්මිය) / සේවකයින් (දේශීය කාන්තාවන්)
බාහිර පාර්ශ්වය: විදේශීය පාරිභෝගිකයින් / රජය *(ලකුණු 01)*

(ආ) 1. ගෝලීය (ජාත්‍යන්තර) පරිසරය
2. තාක්ෂණික පරිසරය *(ලකුණු 01)*

(iv)

(අ) **A** - දේශීය වෙළෙඳාම (තොග වෙළෙඳාම)
B - විදේශීය වෙළෙඳාම (ආනයන වෙළෙඳාම) *(ලකුණු 01)*

(ආ) බැංකු / රක්ෂණය / ප්‍රවාහනය / සන්නිවේදනය *(ඕනෑම 2 කට ලකුණු 01)*

මුලු ලකුණු (08)

3.

(i)

- **ජංගම ගිණුම:** චෙක්පත් භාවිතයෙන් ගනුදෙනුකල හැකිය / පොලියක් හිමි නොවේ / අයිරා පහසුකම් ලබාගත හැක.
- **ස්ථාවර තැන්පතු ගිණුම:** චෙක්පත් භාවිත කළ නොහැක / ඉහළ පොලී අනුපාතයක් හිමි වේ / නියමිත කාල සීමාව අවසන් වන තෙක් මුදල් ආපසු ලබාගත නොහැක. *(ඕනෑම නිවැරදි වෙනස්කම් 2 කට ලකුණු 02)*

(ii)

(අ) සත්‍ය
(ආ) අසත්‍ය
(ඇ) සත්‍ය
(ඈ) අසත්‍ය (ලකුණු 1/2 කට බැගින්) *(ලකුණු 02)*

(iii)

(අ) ගිනි අවදානම / අකුණු සැර වැදීම *(ලකුණු 01)*
(ආ) අලාභපූරණ මූලධර්මය *(ලකුණු 01)*

(iv)

(අ) සමාජ මාධ්‍ය (Social Media) / විද්‍යුත් තැපෑල (E-mail) *(ලකුණු 01)*

(ආ)

- ව්‍යාපාරික තීරණ නිවැරදිව හා කාර්යක්ෂමව ගැනීමට හැකි වීම.
- පාරිභෝගිකයින් හා සැපයුම්කරුවන් සමඟ හොඳ සබඳතාවක් පවත්වාගෙන යාමට හැකි වීම.
- පිරිවැය හා කාලය ඉතිරි වීම.
- ප්‍රචාරණය තුලින් ආදායම් ඉහල යාම *(ඕනෑම කරුණු 2 කට ලකුණු 01)*

4.

(i) ව්‍යාපාරයේ අනාගත ඉලක්ක හා අරමුණු සපුරා ගැනීම සඳහා කළ යුතු ක්‍රියාමාර්ග, ඒවා ඉටු කරන ආකාරය සහ ඊට අවශ්‍ය සම්පත් කලින් තීරණය කිරීමේ ක්‍රියාවලියයි. *(ලකුණු 02)*

(ii)

(අ) සත්‍ය
(ආ) අසත්‍ය
(ඇ) සත්‍ය
(ඊ) අසත්‍ය *(ලකුණු 02)*

(iii)

A - මිල (Price)
B - නිෂ්පාදිතය (Product)
C - ස්ථානය (Place)
D - ප්‍රවර්ධනය (Promotion) *(ලකුණු 02)*

(iv)

(අ)

A - ලාභාංශ / ප්‍රාග්ධන ලාභ
B - පොලී ආදායම *(ලකුණු 01)*

(ආ)

- **අවදානම් වැඩි ආයෝජන මාර්ගය:** සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීම **(A)**
- **හේතුව:** සමාගමේ ලාභදායීත්වය අනුව ලැබෙන ලාභාංශ වෙනස් වීම, සමාගම් පාඩු ලැබුවහොත් ලාභාංශ නොලැබීම සහ කොටස්වල වෙළෙඳපොළ මිල වෙනස් වීම මගින් ප්‍රාග්ධන අලාභ සිදු වීමේ අවදානම පැවතීම. *(ලකුණු 01)*

මුලු ලකුණු -08

5. **(i)**

- **අයිතිකරුවන් / ආයෝජකයින්:** ව්‍යාපාරයේ ලාභදායීත්වය සහ ආරක්ෂාව දැනගැනීමට.
- **ණය හිමියන් / බැංකු:** ව්‍යාපාරයට ණය ලබාදීමට සහ නැවත අයකර ගැනීමේ හැකියාව තක්සේරු කිරීමට.

(වෙනත් නිවැරදි හාවිත කරන්නෙකු හා තොරතුරු අවශ්‍යතාවයකට ලකුණු 02)

(ii)

- වත්කම් අත්පිට මිලදී ගැනීම, වියදම් සඳහා මුදල් ගෙවීම, අයිතිකරුගේ ගැනිලි *(ලකුණු 02)*

(iii)

(අ)

(1) රු 40 000 ක ලී බඩු ණයට මිලදී ගැනීම

(2) බැංකු ණය සඳහා රු 15 000 ක් මුදල් ගෙවීම *(ලකුණු 02)*

(ආ)

	වත්කම්			=	හිමිකම්	+	වගකීම්
	ලී බඩු	+	මුදල්	=		+	ණයහිමියෝ +බැංකු ණය
(3)		+	25 000				
		-	20 000	=	+ 5 000		
(4)		-	10 000	=	- 10 000		

(ලකුණු 02)

(iv)

(අ) **ගැනුම් ජර්නලය**

දිනය	ඉන්වොයිස් අංකය	සැපයුම්කරුගේ නම	වටිනාකම
2026.05.02	101	අමල්	80 000
2026.05.10	105	කමල්	60 000
2026.05.18	110	අමල්	45 000
2026.05.25	112	නිමල්	70 000
2026.05.31		ගැනුම් ගිණුමට හරකලා	**255 000**

(ලකුණු 02)

(ආ) **ද්විත්ව සටහන:**

ගැනුම් ගිණුම - හර රු. 255 000

ණය හිමියන්ගේ ගිණුම් - බැර

අමල්	80 000
කමල්	60 000
අමල්	45 000
නිමල්	70 000

(ලකුණු 02)

මුලු ලකුණු - 12

6. **(i)**

- **වත්කම් :** අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අනාගතයේදී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා එන්නා වූ ව්‍යාපාරයක් විසින් පාලනය කරන සම්පත් වත්කම් වේ.
- **වගකීම් :** අතීත හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ව්‍යාපාරයක් විසින් ගෙවිය යුතු අගයන් වගකීම් වේ. *(ලකුණු 02)*

(ii)

(අ) **ප්‍රාථමික පිරිවැය = <u>රු. 80 000</u>** (ඍජු ද්‍රව්‍ය (50 000) + ඍජු ශ්‍රමය (30 000)

(ආ) **ඒකක නිෂ්පාදන පිරිවැය: <u>රු 110</u>**

මුළු නිෂ්පාදන පිරිවැය = ඍජු (80 000) + පොදු (10 000 + ව 8 000+12 000) = රු. 110 000

ඒකක පිරිවැය = රු. 110 000 / 1 000 = **රු. 110** *(ලකුණු 02)*

(iii)

(අ) **පොදු ජර්නලය**

දිනය	විස්තරය	හර	බැර
	විදුලි ගාස්තු ගිණුම හර	7 200	
	අවිනිශ්චිත ගිණුම		7 200
	(ගෙවූ විදුලි ගාස්තු එම ගිණුමේ අඩුවෙන් සටහන් වීම නිවැරදි කිරීම)		1

PAST PAPERS WIKI

	අවිනිශ්චිත ගිණුම හර ලද වට්ටම් ගිණුම (ලද වට්ටම් රු 5 000 ක එම ගිණුමට හර කිරීම නිවැරදි කිරීම) යන්ත්‍ර අලුත්වැඩියා වියදම් ගිණුම හර යන්ත්‍ර ගිණුම (යන්ත්‍ර අලුත්වැඩියා වියදම් ගෙවීම යන්ත්‍ර ගිණුමේ සටහන් වීම නිවැරදි කිරීම)	10 000 12 000	10 000 (1) 12 000 (1)

සංලක්ෂය නොමැති නම් ලකුණක් අඩුකරන්න

(ආ)

අවිනිශ්චිත ගිණුම

			ශේෂය	2 800	
ල.1/2	ලද වට්ටම්	10 000	විදුලි ගාස්තු	7 200	ල.1/2
		10 000		10 000	

(ලකුණු 04)

(iv)

(අ) **සංශෝධිත මුදල් පොත**

දිනය	විස්තරය	රු.	දිනය	විස්තරය	රු.
01.31	ශේෂය ඉ/ග	25 000	01.31	බැංකු ගාස්තු	1 000*
01.31	සෘජු තැන්පතු	*12 000	01.31	චෙක්පත් පොත් ගාස්තු	2 000*
			01.31	ශේෂය ඉ/ග	34 000*
		37 000			37 000

***අයිතමයකට ලකුණු ½ බැගින්**

(ලකුණු 02)

(ආ) **බැංකු සැසඳුම් ප්‍රකාශනය**

සංශෝධිත මුදල් පොත් ශේෂය		34 000
එකතු කළ යුතු: ඉදිරිපත් නොකල චෙක්පත්	103 – 6 000*	
	104 – 8 000*	14 000
		48 000
අඩු කළ යුතු: තැන්පත්කල නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්		
චෙක් අංක 425	20 000*	
822	10 000*	(30 000)
බැංකු ප්‍රකාශනයේ ශේෂය		18 000

***අයිතමයකට ලකුණු ½ බැගින්**

(ලකුණු 02)

මුලු ලකුණු - 12

7.

(i) ව්‍යාපාරය විසින් තම ජංගම ගිණුම යොදා ගනිමින් නිකුත් කරන ලද හෝ තැන්පත් කරන ලද චෙක්පත් ගිණුමේ මුදල් නොමැතිකම, ආදර්ශ අත්සනින් වෙනස්වීම හෝ චෙක්පත අවධිමත්ව ලියා තිබීම වැනි විවිධ හේතූන් නිසා බැංකුව විසින් චෙක්පත් ප්‍රතික්ෂේප කිරීම චෙක්පත් අගරු වීමයි.

(ලකුණු 02)

(ii) **2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම**

ආදායම්:		
සාමාජික මුදල්		*70 000
වියදම්:		
ගොඩනැගිලි අලුත්වැඩියා (15 000 + 5 000)	*20 000	
සංගීත ප්‍රසංග වියදම්	*25 000	(45 000)
අතිරික්තය		*25 000

(ලකුණු 02)

***අයිතමයකට ලකුණු ½ බැගින්**

(අ) ප්‍රසන්නගේ ව්‍යාපාරය

2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය ල. ½

විකුණුම්			480 000
අඩුකළා- විකුණුම් පිරිවැය			
ආරම්භක තොගය		50 000	
ගැනුම්		220 000	
		270 000	
(-)අවසාන තොගය	ල. ½	(60 000)	(210 000)
දළ ලාභය			270 000
එකතුකළා-: වෙනත් ආදායම්			
පොලී ආදායම්		ල. ½	14 000
			284 000
බෙදාහැරීමේ වියදම්			
මෝටර් රථ ක්ෂය ල. ½	30 000		
බොල්ණය ල. ½	5 000	35 000	
පරිපාලන වියදම්			
විදුලි ගාස්තු	12 000		
ගෙවූ කුලී	18 000		
දුරකථන ගාස්තු	6 000		
රක්ෂණ ගාස්තු	5 000		
පරිගණක යන්ත්‍ර ක්ෂය ල. ½	8 000	49 000	
මූල්‍ය හා වෙනත් වියදම්			
වෙනත් වියදම්	4 000		
බැංකු ණය පොලිය ල. ½	15 000	19 000	(103 000)
ශුද්ධ ලාභය පාග්ධණ ගිණුමට	මාරුකලා	ල. ½	181 000

(ලකුණු 04)

PAST PAPERS WIKI

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ආ) ප්‍රසන්නගේ ව්‍යාපාරය

2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ල. ½

ජංගම නොවන වත්කම්	පිරිවැය	සංචිත ක්ෂය	ශුද්ධ අගය
ඉඩම්	500,000		500,000
මෝටර් රථ	300,000 ල.	½ (30,000)	270,000
පරිගණක යන්ත්‍ර	80,000 ල.	½ (8,000)	72,000
			842,000
ජංගම වත්කම්			
අවසාන තොගය		60 000	ල. ½
ණයගැතියෝ		40,000	ල. ½
ලැබිය යුතු පොලී		4 000	ල. ½
මුදල්		30,000	129 000
මුළු වත්කම්			**971 000**
හිමිකම සහ වගකීම්			
හිමිකම			
ආරම්භක ප්‍රාග්ධනය		600,000	
එකතු කළ යුතු: ශුද්ධ ලාභය	ල½	181,000	781,000
ජංගම නොවන වගකීම්			
10% බැංකු ණය			150,000
ජංගම වගකීම්			
ණයහිමියෝ		35,000	
ගෙවිය යුතු බැංකු ණය පොලිය		ල. ½ 5,000	40,000
මුළු හිමිකම සහ වගකීම්			**971 000**

(ලකුණු 04)

මුලු ලකුණු - 12

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library